14

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2023 - 03 - 08 |

පැමිණිලිකරු : කන්දඋඩ ආරච්චිගේ ධීමත් ආනන්ද මයා,
37/3, බටුහේන, වළල,
මැණික්හින්න.

වගඋත්තරකරුවන් : 01. ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය,
කොළඹ 01.

02. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. පො.ප හලංගොඩ මයා
මූලස්ථාන පොලිස් පරීක්ෂක
පොලිස් ස්ථානය,
මහනුවර.

වර්තමාන සේවා ස්ථානය - පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

<u>පැමිණිලි අංකය : HRC/575/17</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු සිය පැමිණිල්ල තුළින් දක්වා ඇත්තේ, තමා ජාතික වශයෙන් වැදගත් ඓතිහාසික ස්ථාන දෙකක් වූ සීගිරිය සහ මහනුවර ශ්‍රී දළදා මාලිගාව ආශ්‍රිත පුරාවිද්‍යාත්මක හා බෞද්ධ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින අයෙකු බවත්, එම ස්ථාන වලට සිදු කළ හානිදායක



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர்: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு: 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

ක්‍රියාකාරකම් වලට එරෙහිව කටයුතු කරන අයෙකු බවත්ය. එකී ස්ථානවල සිදුවන අක්‍රමිකතා හෙළි කළ ගිහි හා පැවිදි තැනැත්තන් අභිරහස් ලෙස මියයාම හිතාමතා කළ ඝාතන ලෙස තමා දකින බවද ඒවා එම ස්ථානවල සිදුවන විනාශකාරී ක්‍රියාවන් පිළිබඳ හෙළි කිරීම හේතුකොටගෙන සිදුවූ ඒවා බවද පැමිණිලිකාර තමාද එම ස්ථානවල පවතින අක්‍රමිකතා හා අකටයුතුකම් පිළිබඳ ප්‍රසිද්ධියේ කරුණු දැක්වීම මත වෙඩි තැබීමකට ලක් වූ බව ද ප්‍රකාශ කර ඇත. එමෙන්ම දැඩි ලෙස මරණ තර්ජන පිළිබඳව ඉහත කී 03 වන වගඋත්තරකරු වෙත කරන ලද පැමිණිලි විභාග නොකිරීම හා නැතිනම් විභාග කිරීමේදී අසාධාරණ ලෙස විභාග කිරීම සිදු වූ බවද 03 වන වගඋත්තරකාර පොලිස් ස්ථානයට පමණක් නොව වත්තේගම පොලිසියටද මැණික්හින්න පොලිසිය වෙතද කළ පැමිණිලි විභාග කිරීමේදී පවා මෙම අසාධාරණය සිදුවූ බව දක්වමින් තම ජීවිතයට සිදුවියහැකි බරපතල හානි හෝ ජීවිත හානියක් සිදුවීමේ තත්ත්වයක් වළක්වා ගැනීම මෙම පැමිණිල්ල ගොනු කිරීමෙන් බලාපොරොත්තු වන සහනය බවද දක්වා ඇත

පැමිණිල්ලේ ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇති ලේඛන අනුව, පැමිණිලිකරු විසින් මහනුවර නගරයේ බැනරයක් ප්‍රදර්ශනය කරමින් අඬබෙරයක් වාදනය කිරීමට කටයුතු කළ අවස්ථාවේදී දළදා මාලිගාවේ රාජකාරී වල නිරතවූ නිලධාරීන් පිරිසක් පැමිණ තම බැනරය කපා අඬ බෙරය මහනුවර වැවට විසි කළ බවත් ඒ අනුව කළ පැමිණිල්ල 03 වන වගඋත්තරකරු විසින් සාධාරණව විභාග නොකිරීමෙන් තම අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට එරෙහිව 03 වන වගඋත්තරකරු කටයුතු කර තිබීම මත සහ ඊට අදාළව පියවර නොගැනීම සම්බන්ධව අනෙකුත් වගඋත්තරකරුවන් වෙතද කරන ලද දැන්වීම් ප්‍රකාරව ක්‍රියා නොකිරීමෙන් සියළුම වගඋත්තරකරුවන් විසින් තම මූලික අයිතිවාසිකම් කඩ කළ බවට පැමිණිලි කර සිටින බවය..

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

පැමිණිලිකරු විසින් මහනුවර පොලිස් ස්ථානයේ ගොනු කරන ලද පැමිණිලි වලට අදාළව කරුණු දක්වමින් මහනුවර මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් ඉදිරිපත් කර ඇති 2019.03.20 දිනැති අංක : 1023/2019 දරණ වාර්තාව සහ 2017.10.23 දිනැති අංක 837/17 දරණ වාර්තාව යටතේ දක්වා ඇත්තේ, තොරතුරු සටහන් පොත්වල පිටුව හා ඡේදය සඳහන් කර ඇතත්, දිනය හෝ වේලාවක් සඳහන් කර නොමැති නිසා නිවැරදි දත්ත නොතිබීමෙන් පැහැදිලි පිළිතුරක් ලබාදීමේ අපහසුතාවයක් ඇති බවයි. ඒ අනුව නැවත වාර්තාවක් ලබාගැනීමට කටයුතු කිරීම අනුව මැණික්හින්න පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් 2019.03.01 දිනැති තම අංක 681/18 යටතේ පැමිණිලිකරු 2018.12.03 දින සී.අයි.බී. II 192/19 යටතේ කරන ලද පැමිණිල්ල තුළින් බැනරය හා අඬ බෙරය දළදා මාලිගාවේ රාජකාරී කළ සැරයන් සුමතිපාල යන අය විසින් ඉවත් කළ බවට පැමිණිල්ලක් කර ඇති බව දක්වා ඇත. මේ සම්බන්ධව මහනුවර පොලිස් ස්ථානය විසින් විමර්ශනයක් සිදු කර ඇති බවද මැණික්හින්න පොලිස් ස්ථානයට කළ පැමිණිල්ල අදාළ නිලධාරියාගේ ප්‍රකාශ සටහන් කර ගැනීමෙන් පසු මූල්

සිදුවීම මහනුවර පොලිස් වසමේ සිදුවී ඇති බැවින් දෙපාර්ශවය කැඳවා පරීක්ෂණය කර අවශ්‍ය උපදෙස් ලබාදෙන ලද බව දක්වා ඇත.

තවද මැණික්හින්න පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ලේ පිටපතක් ලබාදී ඇති අතර, එම පැමිණිල්ලට අනුව 'දළදා මාලිගාවේ එවකට සාජන් සුමතිපාල යන අය රාජකාරි කටයුතු කළ බවද පැමිණිලිකරුට එරෙහිව නිතර මහනුවර නගරයේදී පැමිණිලිකරු වංචාකාරයෙක් හා බොරු කාරයෙක් ලෙස ප්‍රකාශ කරමින් හැසිරෙන බවද' දක්වා පැමිණිල්ල ගොනු කර ඇති බව දක්වා ඇත. එමෙන්ම මෙම පැමිණිල්ලට අදාළව මධ්‍යම පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙතින් වාර්තාවක් ලබාගැනීමට කටයුතු කරන ලද අතර, 2019.07.22 දින අංක: එස්/ඩීඅයිජී/සීපී/එස්අයි/123/17 දරණ වාර්තාව මගින් "දළදා මාලිගාවේ සිදුවන දූෂණ හා වංචා සම්බන්ධයෙන් බෞද්ධ ජනතාව දැනුවත් කිරීම සඳහා මහනුවර ක්වීන්ස් හෝටලය ඉදිරිපිට වැව් බැම්ම අසල බැනරයක් ප්‍රදර්ශනය කරමින් පැමිණිලිකරු අඬබෙර වාදනය සිදු කරන අවස්ථාවේදී දළදා මාලිගාව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් පැමිණ බැනරය කපා දමා අඬබෙරය වැවට විසි කළ බවටද පො.සැ.21624 සුමතිපාල යන නිලධාරියා ඊට සම්බන්ධව සිටි බවටද" දක්වමින් කරන ලද පැමිණිල්ල මහනුවර නියෝජ්‍ය පොලිස්පති මගින් පරීක්ෂා කිරීමට යොමු කළ බව ද පසුව එය මහනුවර පොලිස් අධිකාරි I විජිත ද අල්විස් මහතා මගින් විමර්ශනය කර සීආර්/එස්අයි/114/17 හා 2019.07.13 දිනැති වාර්තාව මගින් කරුණු ලබාගෙන ඇති බවද දක්වා ඇත.

එකී වාර්තා අනුව ඉහත කී පොලිස් සැරයන්වරයා විසින් දක්වා ඇත්තේ. "තමා පැමිණිලිකරු දන්නා හඳුනන බවත් 2017.04.11 දින දළදා මාලිගාව ඉදිරිපිට දී ඔහු හමුවූ බවත්, බැනරය සහ අඬබෙරය කවුරුන් විසින් රැගෙන යන ලද්දේ ද යන්න තමා නොදන්නා බවත්" ය. තවද දළදා මාලිගාව පොලිස් ස්ථානයේ හිටපු පොලිස් ස්ථානාධිපති වන පො.ප. හලංගොඩ යන නිලධාරීවරයා විසින් දක්වා ඇත්තේ, "එය දළදා මාලිගා පරිශ්‍රයෙන් පිටත සිදුවූ සිදුවීමක් බැවින් ඒ පිළිබඳ සොයා බැලීමක් ඔහු විසින් සිදු නොකළ බවද අඬ බෙරය හෝ බැනරය පිළිබඳ තමා නොදන්නා බවත්ය." මහනුවර නියෝජ්‍ය පොලිස්පතිගේ වාර්තාව අනුව 'පැමිණිලිකරුගේ අඬබෙරය හෝ බැනරය පැහැර ගත්තේ කව්රුන්ද යන්න අනාවරණය නොවන බව' දක්වා ඇත.

**පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරු සීගිරිය සහ දළදා මාලිගාව ආශ්‍රිතව සිදුවන අකටයුතුකම් හා දූෂණ ද වංචාකාරී ක්‍රියාවන්ද තුළින් එකී ස්ථාන වල පවතින පුරාවිද්‍යාත්මක සාධක සහ සමස්ථ බෞද්ධ ජනතාවගේ අයිතිවාසිකම් අහිමි වන ආකාරයට කටයුතු කරන පුද්ගලයින් සහ ආයතන වලටද ව්‍යාපෘති වලටද

එරෙහිව නිතර ක්‍රියාකාරීව ඉදිරිපත්ව විරෝධතාවය දක්වන අයෙකු බව පෙන්වා දී ඇත. ඒ අනුව ඔහුගේ ජීවිතයට සිදුවූ මරණීය තර්ජන හා වෙඩිතැබීමේ සිදුවීම් අනුව ප්‍රතිකාර ගන්නා ලද අවස්ථා සම්බන්ධවද පැමිණිලිකරු සතු වෛද්‍ය සහතික සහ වෙනත් ලේඛන ද පොලිස් මූලස්ථානය දක්වා කරන ලද විවිධ පැමිණිලිද ඉදිරිපත් කර කරුණු දක්වා ඇත.

සීගිරිය සම්බන්ධව කරන ලද පැමිණිලි හා එම ස්ථානයේ සිදුවන පුරාවිද්‍යාත්මක වටිනාකම් හා සාධක විනාශ වී යන ආකාරයට කටයුතු කර තිබීම පිළිබඳව පැමිණිලි විභාග කරන ලද අවස්ථාවේ පැමිණිලිකරු කියා තිබීම පිළිබඳ මෙම ගොනුවේ කරුණු වාර්තා කර තිබුණද එම සීගිරිය ආශ්‍රිත ඇති වන සංස්කෘතික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට එරෙහිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කළ පැමිණිලිකරුගේ වෙනත් පැමිණිල්ලක් විභාග වෙමින් පැවතීම මත එකී කරුණු මෙම වාර්තාවට ඇතුළත් නොකිරීමට තීරණය කර ඇත.

මහනුවර මූලස්ථාන පොලිස් පරීක්ෂක වෙනුවෙන් 2017.07.24 දිනැති පරීක්ෂණ අවස්ථාවේදී පෙනී සිටි උ.පො.ප.එම්.ජ්.එම්.රම්සාන් මහතා ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුගේ පැමිණිලි වලට අදාළව තොරතුරු පොත් වල අංක හා දින ලැබී නොමැතිව තිබූ බැවින් ඒ පිළිබඳ පියවරක් ගැනීමට එම අවස්ථාවේ නොහැකිව පවතින බවය. එහිදී සීඅයිබී (V– 51/103 හා 2017.04.11 දිනැති බැනරය හා බෙරය සම්බන්ධ පැමිණිල්ල පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීමට එදින පැමිණි වගඋත්තරකරුට දන්වා ඇත. තවද 2021.12.21 දින පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරුවන් ඉදිරිපත්ව කරුණු දක්වා නොමැති අතර, වගඋත්තරකරුවන් 2022.01.20 දින පරීක්ෂණයට ඉදිරිපත්ව මහනුවර පොලිස් ස්ථානයේ පො.සැ.47287 ලියනආරච්චි මහතා මගින් කරුණු දක්වා ඇත. වගඋත්තරකරු එදිනද සඳහන් කර ඇතතේ, පැමිණිල්ලට අදාළව ලබාදී ඇති පැමිණිලි අංක ප්‍රමාණවත් නොවන බවයි. නමුත් පැමිණිලි අංකය සහ පිටු අංක ද ඡේද අංක ද ඉදිරිපත් කර තිබියදී තොරතුරු ලබාදිය නොහැකි වීමට හේතු විමසා සිටීමේදී පැමිණිල්ල කළ දිනය ද අවශ්‍ය බව වගඋත්තරකරු දක්වා ඇත. නමුත් පැමිණිලිකරු කියා සිටින්නේ තොරතුරු ලබාදීමට හැකියාව ඇතත්, වගඋත්තරකරුවන් තොරතුරු ලබා නොදෙන බවත් 2022.01.19 දින මහනුවර නගරයේදී මහනුවර පොලිසියේ නිලධාරීන් දෙදෙනෙකු සිවිල් ඇඳුමින් පැමිණ පැමිණිලිකරු හඳුනාගත් පසු 'හෙට දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ල විභාග වනවා නේද' යන්න විමසූ බවත්, තමා "ඔව්" යනුවෙන් ප්‍රකාශ කළ පසු "කොමිෂන් සභාවේ පෝරකයක් තිබෙනවාද එහෙ අළුගෝසුවෙක් ඉන්නවාද" කියා සමච්චල් කරන ලද බවත්ය. තවද තමාට ප්‍රශ්නයක් ඇති කිරීමට එකී පොලිස් නිලධාරීන් දෙදෙනා කටයුතු කරන බව පෙනී ගිය බැවින් පැමිණිලිකරු එම ස්ථානයෙන් ඉවත්ව ගිය බවද සඳහන් කර ඇත.

**නිරීක්ෂණ සහ නිගමන :-**

පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ලට අදාලව ලද තොරතුරුද ලැබී ඇති වාර්තාද පරීක්ෂණ දිනයන්හිදී ඉදිරිපත් වූ කරුණු ද අනුව පහත සඳහන් කරුණු නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති මෙම අංක දරණ ගොනුවට ඇතුලත් නොවූ පැමිණිලිකරු විසින් අද දින වනවිට ගොනු කර තිබූ වෙනත් පුරාවිද්‍යාත්මක සාධක සහ බෞද්ධ ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් වලට එරෙහිව ගොනු කළ පැමිණිලි වල ලේඛන වෙතද අවධානය යොමු කිරීමේදී, ඔහු නිතර ක්‍රියාකාරීව එම කරුණු සම්බන්ධව ප්‍රසිද්ධියේ අදහස් ප්‍රකාශ කරන්නෙකු බව පෙනී යයි. එමෙන්ම ඔහු විසින් මෙම ගොනුවට ඉදිරිපත් කළ 2018.02.26 දිනැති දිව්රුම් ප්‍රකාශයට අනුව 2002 වසරේ දී එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදී සංවිධානයේ ගැටුම් ක්‍රියාත්මකව පැවතියදී සිංහල දමිළ සාමය ප්‍රවර්ධනය උදෙසා පිරිත්පැන් සහ සහලින් තැනූ රසකැවිලි ලොරියක් පුරවා උතුරට රැගෙන ගොස් දෙමළ ජනතාව වෙත බෙදා දෙමින් කටයුතු කර කිලිනොච්චියේදී ත්‍රස්තවාදීන්ගේ අත්අඩංගුවට පත්ව ජීවිතය බේරා ගන්නා ලද අයෙකු බවද නිරීක්ෂණය වේ. බෞද්ධ පුනර්ජීවනයක් ඇති කිරීම සඳහා දළදා මාලිගාව ඉදිරිපිට 2002 වසරේ සිට සාම වැඩසටහන් හා අනගාරික ධර්මපාලතුමාගේ ක්‍රියාකාරකම් අනුව විවිධ වැඩසටහන් ඔහු සිදු කර ඇති බවද පෙනී යන අතර, අවස්ථා සියයකට වඩා වාර ගණනක් තම ලේ දන් දීමෙන් දායක වී ඇති අයෙකු බවද නිරීක්ෂණය වේ. එමෙන්ම ඔහුගේ කරුණු ඉදිරිපත් කිරීම් අනුව සීගිරිය හා මහනුවර දළදා මාලිගාව ආශ්‍රිතව සිදුවූ බවට ඔහු විසින් දැඩි ලෙස කරුණු දක්වමින් වංචා, දූෂණ, මනුෂ්‍ය ඝාතන සම්බන්ධව ලිඛිතවම වගකිවයුතු වගඋත්තරකරුවන් වෙත නිතර කරුණු ඉදිරිපත් කරමින් ප්‍රසිද්ධියේ අදහස් ප්‍රකාශ කළ අයෙකු බවද අනාවරණය විය. එමෙන්ම ඔහු එක් අවස්ථාවක වෙඩි තැබීමකට ලක්වූ අයෙක් බවද ඉදිරිපත් කරන ලද වෛද්‍ය සහතික අනුව පැහැදිලි වේ.

මෙම කරුණු අනුවද් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට එවන ලද 2019.07.22 දිනැති පෙර කී වාර්තාව අනුවද පැමිණිලිකරු විසින් තම බැනරය සහ අඩබෙරය පැහැරගත් බවට කරන ලද පැමිණිල්ලක් තිබී ඇති බවත් එවැනි පැමිණිල්ලක් ලැබී තිබීම අනුව පරීක්ෂණයක් සිදු කර ඇති බවත් නිරීක්ෂණය වේ. එකී පැමිණිල්ල විභාග කිරීමට මධ්‍යම පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එස්.එම්. වික්‍රමසිංහ මහතා විසින් මහනුවර නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කළ බවට නියෝජ්‍ය පොලිස්පති මහනුවර විසින් පොලිස් අධිකාරී I විජිත ද අල්විස් මහතා මගින් විමර්ශනයක් සිදු කර අංක : සීආර්/එස්අයි/114/17 හා 2019.07.13 දින වාර්තා කර ඇති බවද දක්වා තිබීම අනුව පැමිණිලිකරුගේ පැමිණිල්ලක් තිබී ඇති බවත්, එය විභාග කර ඇති බවත් තහවුරු වේ. නමුත් මහනුවර ප්‍රධාන පොලිස් පරීක්ෂක වෙතින් වාර්තා කැඳවීමේදී තොරතුරු පොත්වල ජේද හා අංක නොමැති බැවින් පිළිතුරු ලබාදිය නොහැකි බව කොමිෂන් සභාවට දන්වා ඇතත්, එකී තොරතුරු හා අංක ලබාදීමෙන් පසු කොමිෂන් සභාවේ 2022.01.20

දිනැති පරීක්ෂණයේදී මූලස්ථාන පොලිස් පරීක්ෂක වෙනුවෙන් පො.සැ 47287 ලියනආරච්චි මහතා පෙනී සිටිමින් දක්වා ඇත්තේ, තොරතුරු පොතේ ඡේද හා අංක ලබාදුන් නමුත් දිනය නොමැතිවීමෙන් කරුණු දක්වා සිටිය නොහැකි බවය. එහෙත් 2019.07.13 වන දින වනවිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදු කර වාර්තා කර තිබියදී මෙම සිදුවීමට අදාළව මහනුවර පොලිස් මූලස්ථානයේ කරුණු ඉදිරිපත් කිරීමට තොරතුරු ප්‍රමාණවත් නොවන බවට ප්‍රකාශ කිරීම පිළිගතහැකි එකක් නොවන බවද අනාවරණය වේ.

කෙසේ වෙතත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ වාර්තාව අනුව පෙනී යන්නේ පැමිණිලිකරුගේ පැමිණිල්ලක් මහනුවර පොලිස් ස්ථානයට ලැබී ඇති බවය. එමෙන්ම පැමිණිලිකරු මේ පිළිබඳ එවකට පොලිස් දෙපාර්තමේන්තුව භාර නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය වෙතද පැමිණිලි කර තිබී ඇති බව පෙනී යන අතර, මෙම පැමිණිල්ල කුමක්ද යන්න පිළිබඳව එකී කාල වකවානුවේ ප්‍රධාන මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් යම් ආකාරයකට දැන නොසිටියේ ය යන්න පිළිගත නොහැකි කාරණාවක් වන්නේ මෙය පොලිස් දෙපාර්තමේන්තුව භාර අමාත්‍යාංශය විසින්ද මධ්‍යම පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින්ද මහනුවර පොලිස් අධිකාරී වෙතින්ද පරීක්ෂණ කටයුතු සිදු කළ පැමිණිල්ලක් බැවිනි. එහෙත් පැමිණිල්ල විභාග කිරීමෙන් අනතුරුව එවැනි බැනරයක් හෝ අඩබෙරයක් නොදන්නා බවට කරුණු ප්‍රකාශ කර පරීක්ෂණ කටයුතු අවසන් කර තිබීම පිළිබඳවද සෑහීමකට පත්විය නොහැකි බව පෙනී යයි.

පැමිණිලිකරු අඩබෙර ගසමින් බැනර් ප්‍රදර්ශනය කරමින් 2017.04.11 දින කටයුතු කළ බව පිළිගතහැකි කාරණාවක් වන්නේ ඔහු විසින් 2002 වසරේ සිට කරන ලද විවිධ සමාජ ක්‍රියාකාරකම් හා අදහස් ප්‍රකාශ කිරීමේ ප්‍රසිද්ධ ක්‍රියාකාරකම් පිළිබඳ මූලින් ප්‍රකාශ කළ පරිදි කටයුතු කර ඇති අයෙකු බැවිනි. එමෙන්ම ඔහු විසින් තම බැනරය හා අඩබෙරය පැහැර ගත් බවට ව්‍යාජ පැමිණිල්ලක් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවද නිරීක්ෂණය වේ. මෙම අවස්ථාවේ පැමිණිලිකරුගේ පැමිණිල්ල පිළිබඳ සාධාරණ පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කෙරී නැති බවද පෙනී යන අතර, පැමිණිලිකරු ප්‍රකාශ කරන පරිදි යම් ආකාරයකට මෙම බැනරය කපා අඩ බෙරය ඉවත් කිරීමට පොලිස් නිලධාරීන් හෝ ඔවුන්ගේ බලය හා ආරක්ෂාව මත දළදා මාලිගා පරිශ්‍රය හෝ මෙකී විරෝධතාවයට අකමැති වූ තැනැත්තන් සමූහයක් විසින් එක්ව කටයුතු කර ක්‍රියා කර ඇති බව නිගමනය කළ හැක. තවද මෙහිදී ඔහු පැමිණිලිකරුගේ බැනරය කපා අඩබෙරය පැහැරගෙන නුවර වැවට විසි කරන ලද්දේ කව්රුන් විසින් වුවද එය එම අවස්ථාවේ දළදා මාලිගාව පොලීසියේ පොලිස් නිලධාරීන් විසින් ලබාදෙන ලද ආරක්ෂාව මත සිදු කර ඇති බවට පැමිණිලිකරු සිදු කරනු ලබන ප්‍රකාශ බැහැර කළ නොහැකි බව ද නිගමනය කළහැක. ඉන් වගඋත්තරකරුවන් හට ඇති වගකීම වගඋත්තරකරුවන් විසින් ආරක්ෂා කර නොතිබීමෙන් හෝ එකී ගැටුමක් සිදුවන අවස්ථාවේ කළයුතු නිසි මැදිහත්වීමක් නොකිරීමෙන් පැමිණිලිකරුට අගතියක් සිදුවන ආකාරයකට කටයුතු සිදුවීමට ඉඩ හැර ඇති අවස්ථාවක් බව ද නිරීක්ෂණය වේ. අඩ බෙරය පැහැර ගන්නා අවස්ථාවේ පොලිස් නිලධාරීන් එය

සිදු කිරීමෙන් හෝ එය සිදු කරන තැනැත්තන් හට ඊට ඉඩ සැලසීමෙන් නිලධාරීන් සතු වගකීම තවත් තැනැත්තන් හට අහි නියෝජනය කිරීමට ඉඩ සලසා දීමෙන් වගඋත්තරකරුවන් වගකීමකට ලක්වීම බැහැර නොවන බව නිගමනය කරනු ලැබේ.

**නිගමනය :-**

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 14 ව්‍යවස්ථාව ප්‍රකාරව පිළිගත් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම උල්ලංඝනය වන ආකාරයට කටයුතු කරමින් පැමිණිලිකරුගේ පැමිණිල්ලට අදාළ සිද්ධිය සිදුවූ 2017.04.11 දින වන විට කටයුතු කළ දළදා මාලිගාවේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වන පො.ප හලංගොඩ යන නිලධාරියා විසින් මෙම පැමිණිලිකරුගේ පැමිණිල්ල ලද පසු ඒ පිළිබඳ සාධාරණ පරීක්ෂණයක් නොපැවැත්වීමෙන් එවකට සේවය කළ 03 වන වගඋත්තරකරු එනම්, ඉහත කී පො.ප හලංගොඩ යන නිලධාරී විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වන පරිදි කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

1. පැමිණිලිකරුගේ චංචල දේපළ සන්තකයට ගැනීමට හෝ එකී චංචල දේපළ විනාශ වන ආකාරයට කටයුතු සිදුවන තෙක් ඉඩ ලබාදෙමින් කටයුතු කළ පැමිණිල්ලේ සඳහන් සිදුවීම් සිදුවූ 2017.04.11 වන දින දළදා මාලිගාව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ පො.ප හලංගොඩ යන නිලධාරී එකී චංචල දේපළ අතරින් සැළකියහැකි වටිනාකමක් ඇති පැමිණිලිකරුගේ අඩබෙරය විනාශ කර තිබීම හෝ අතුරුදහන් කර තිබීම සම්බන්ධව වගකීම ගනිමින් ඊට අදාළ සාධාරණ වූ වන්දි මුදලක් ලෙස රු.10,000/- ක මුදලක් ලබා දීමට පියවර ගත යුතුය.

2. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගත් භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීමේ කටයුතු තවදුරටත් සිදු කළයුතු බවද නෛතික බලයට යටත් සීමාවන් ඉක්මවා කටයුතු කරමින් මූලික අයිතිවාසිකම් යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ව්‍යවස්ථාපිත භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම උල්ලංඝනය නොකළ යුතු බවට නිලධාරීන් දැනුවත් කිරීමට පොලිස්පති විසින් ක්‍රියා කළයුතු බවටද මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.04.21 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. සභාපති
ජාතික පොලිස් කොමිෂන් සභාව
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.

03. පොලිස්පති
පොලිස් මූලස්ථානය කොළඹ.

04. අධ්‍යක්ෂ (පිරිස් හා පාලන) - අදාළ නිලධාරීන් වෙත නිර්දේශය
පොලිස් මූලස්ථානය යොමු කිරීමට
කොළඹ.

සැ.යු - අදාළ මුදල 'මුදල් ඇණවුමක්' මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.

B/